Sample

029

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - IV වන මට්ටම

පළමු වන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - **2023/2024**

ගිවිසුම් නීතිය – **LLU4607**

කාලය : පැය එකයි **(01)** යි

---

දිනය: **2024.10.18** වේලාව : ප.ව.01.30 - ප.ව.02.30

---

මුළු ප්‍රශ්න ගණන - දෙකයි 02

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. නූතන ගිවිසුම් නීතියට බලපාන සාධක හේතු කොට ගෙන 'එකඟතාවය' යන්න ගිවිසුම් නීතිය තුල වෙනස් වී ඇති ආකාරය සාකච්ඡා කරන්න. **(ලකුණු 08)**

2. 'ටොමට්සු ලිමිටඩ්' යනු භාවිතා කරන ලද මෝටර් රථ විකුණන සමාගමකි. ඔවුන් එම වාහන විකුණුම් මිල (Price tag) සඳහන් කොට ප්‍රදර්ශනය කර විකුණනු ලබයි. එක් දිනක් ගයනි රු 3,000,000 ක් ලෙස විකුණුම් මිල සඳහන්ව ඇති මෝටර් රථය මිලදී ගැනීම සඳහා එම සමාගම වෙත පිවිසුනාය. කෙසේවෙතත් එම සමාගමේ අයිතිකරු වන ඩිල්ශාන් පවසන ලද්දේ අදාල දැන්වීමේ මිල වැරදි ලෙස ලකුණු කර තිබී ඇති බවත් එම මෝටර් රථයේ සැබෑ මිල රු 8,000,000 වන බවත් ය. තවදුරටත් ඔහු පවසනුයේ එම මුදල යටතේ අදාල මෝටර් රථය විකිනීමට බලාපොරොත්තුව සිටි බවයි.

   කෙටි සාකච්ඡාවකින් අනතුරුව ඩිල්ශාන් පවසන ලද්දේ අදාල මිලෙහි වෙනස දෙදෙනා අතර බෙදී යන පරිදි ගයනිට එම රථය රු 5,500,000 ක මුදලට මිලදී ගත හැකි බවයි. ඒ වෙනුවට තමාට එම රථය රු 5,000,000 ක මුදලකට මිලදී ගත හැකිදැයි ගයනි විමසා සිටියාය. එය ප්‍රතික්ශේප කරමින් ඩිල්ශාන් කියා සිටියේ තමාට එය විකිණිය හැකි අඩුම මුදල රු 5,500,000 ක් වන බවය. ඒ අනුව ගයනි තමාට තීරණය කිරීමට කෙටි කාලයක් ඉල්ලා සිටි අතර ඩිල්ශාන් ඇයට ඒ වෙනුවෙන් දින තුනක කාලයක් ලබා දුන්නේය. දින දෙකකින් අනතුරුව ගයනි අනාවරනය කරගනු ලැබුවේ එම මෝටර් රථයම ඇයගේ මිතුරියක් වන නිශානි විසින් රු 7,000,000 ක මුදලකට මිලදී ගෙන ඇති බවයි.

   මෙම සිදුවීම් මාලාව තුලින් පැන නගින ගිවිසුම් නීතියට අදාල මූලධර්ම නඩුතීන්දු නීතිය ඇසුරෙන් පහදන්න. **(ලකුණු 12)**

***සියළුම හිමිකම් ඇවිරිණි***